84

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - 2024/2025**

තුන්වන වසර - පළමු සෙමෙස්තර පරීක්ෂණය

**(පවත්වන ලද්දේ මාර්තු 2025)**

# BLM 3131 – Organizational Leadership

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

1) වැඩ පරිසරයක කළමනාකරුවෙකු සහ නායකයෙකු වෙන්කර හඳුනා ගන්නේ කෙසේදැයි විස්තර කොට මෙම භූමිකාවන් දෙකෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න ? (ලකුණු 20)

2) පරිවර්තනීය නායකත්වය නිර්වචනය කොට සංවිධානයක ක්‍රියාකාරිත්වයට පරිවර්තනීය නායකයකුගේ බලපෑම කෙසේ සිදුවන්නේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 20)

3) ශ්‍රී ලංකාවේ සංස්කෘතික පිළිබඳ අවධානය යොමු කරමින් මෙරට සංවිධානයක සාර්ථකත්වයට භාවිතා කළ හැකි සංස්කෘතික නායකත්ව උපාය මාර්ග මොනවාද?

(ලකුණු 20)

4) අර්බුදකාරී අවස්ථාවන්හි දී, ඵලදායි නායකත්වයක් එම අර්බුද ජය ගැනීම සඳහා සංවිධානයකට උපකාර වන්නේ කෙසේද? (ලකුණු 20)

5) අ) ආයතනික සමාජ වගකීම (CSR) ප්‍රවර්ධනය කිරීමේ දී සදාචාරාත්මක නායකත්වයේ කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ආ) වර්තමාන ආයතනික පරිසරය තුළ සංවිධානයක නායකයින්ට ප්‍රජා සංවර්ධන කුසලතා වැදගත් වන්නේ ඇයිදැයි විස්තර කරන්න. (ලකුණු 10)

6) අ) නායකත්වය සහ නවෝත්පාදනය අතර සම්බන්ධතාවය විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

ආ) ඵලදායි නායකත්වය තුළින් සංවිධානයක නවෝත්පාදන සංස්කෘතියක් පෝෂණය කළ හැක්කේ කෙසේදැයි විමසන්න. (ලකුණු 10)

7) රැකියා ස්ථානයේ ව්‍යුහාත්මක, සංස්කෘතික සහ පක්ෂග්‍රාහීත්වය ස්ත්‍රී පුරුෂ සමජභාවයේ අසමානතාවයට දායක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 20)

8) නායකත්ව ශෛලීන් අතුරින් ගැටලු තුළින් අවස්ථාවන් "බුද්ධිමය නායකත්වය" මතුකරගැනීම සඳහා නායකත්වය දිය හැකි ආකාරය පැහැදිලි කරන්න

(ලකුණු 20)

********************

134

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - 2024/2025**

**තුන්වන වසර - පළමු සෙමෙස්තර පරීක්ෂණය**

**(පවත්වන ලද්දේ මාර්තු 2025)**

## BLM 3132- අලෙවි කළමනාකරණය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) පළමු ප්‍රශ්නය ඇතුලුව මුළු ප්‍රශ්න පහක් (05) සඳහා පිළිතුරු සපයන්න

2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

01.

i. අලෙවි කළමනාකරණය නිර්වචනය කොට ව්‍යාපාර තුළ අලෙවි කළමනාකරුවන්ගේ ප්‍රධාන වගකීම් සහ කාර්යයන් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. අලෙවිකරණය ව්‍යාපාර කළමනාකරන ප්‍රවේශයක් ලෙස සුවිශේෂී වන්නේ කෙසේදැයි ප්‍රධාන කරුණු පහක් (05) යටතේ පැහැදිලි කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

02.

i. ව්‍යාපාර තුළ අලෙවි කළමනාකරණය ක්‍රියාවලියක් ලෙස සැලකීමේ දී එහි ඇතුළත් මූලික පියවරයන් මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ඒකාබද්ධ අලෙවිකරණ වැඩසටහනක් යනු කුමක්දැයි විස්තර කොට එහි ඇතුළත් විය යුතු මූලික මෙවලම් හෙවත් සංරචක කෙටියෙන් හඳුන්වා දෙන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

03.

i. පාරිභෝගික හැසිරීම නිර්වචනය කොට අලෙවි කළමනාකරණ වෘත්තීන්හි නිරත වන්නන්හට පාරිභෝගික හැසිරීම පිළිබඳව පුළුල් අවබෝධයක් තිබීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. පාරිභෝගික හැසිරීම පිළිබඳව උත්තේජ-ප්‍රතිචාර ආකෘතියට අනුව පාරිභෝගික මිලදී ගැනීමේ තීරණ ක්‍රියාවලියට අදාළ මූලික අදියරයන් නම් කොට, එම එක් එක් අදියරේදී අලෙවිකරුවන් ක්‍රියාත්මක විය යුතු ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

04.

i. වෙළඳපොළ බණ්ඩනය යනු කුමක්දැයි නිර්වචනය කොට තෝරාගත් පාරිභෝගික භාණ්ඩයක් හෝ සේවාවක් සලකා බලමින් ඊට අදාළ වෙළඳපොළ බණ්ඩනය සඳහා උචිත බණ්ඩන පදනම් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. භාණ්ඩයක් හෝ සේවාවක් සම්බන්ධයෙන් වෙළඳපොළ ඉලක්කරණය සහ ස්ථානගත කිරීම ඉතා තීරණාත්මක අලෙවිකරන තීරණ වන්නේ මන්දැයි සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

05.

i. "වැඩි දියුණු කරන ලද නිෂ්පාදිතයක් ලෙස භාණ්ඩයක් වෙළඳපොළට ඉදිරිපත් කිරීම එය මූලික නිෂ්පාදිතයක් ලෙස ඉදිරිපත් කිරීමට වඩා ඉතා උචිත වේ."

ඔබ ඉහත ප්‍රකාශය සමඟින් එකඟ වන්නේද? සුදුසු පැහැදිලි කිරීම සහ උදාහරණ සහිතව ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 10)

ii. භාණ්ඩයක් හෝ සේවාවක් මිල කිරීමේදී යොදාගත හැකි මූලික මිල කිරීමේ උපාය මාර්ග තුනක් නම් කොට ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

06.

i. අලෙවිකරණ සන්නිවේදන මිශ්‍රයට (ප්‍රවර්ධන මිශ්‍රයට) ඇතුළත් ප්‍රධාන මෙවලම් කෙටියෙන් හඳුන්වා දෙන්න.

(ලකුණු 10)

ii. අලෙවිකරණ බෙදා හැරීමේ උපාය මාර්ග සහ ක්‍රමවේදවල නූතන වෙනස් වීම සහ ප්‍රවණතා පැහැදිලි කරන්න.

(ලකුණු 10)
**(මුළු ලකුණු 20)**

07. පහත මාතෘකා අතුරින් තෝරාගත් හතරක් සම්බන්ධයෙන් කෙටි සටහන් ලියන්න.

i. අලෙවිකරණ පරිසර විශ්ලේෂණය

ii. සේවා අලෙවිකරණ අභියෝග සහ අලෙවිකරණ ත්‍රිකෝණය

iii. නිෂ්පාදන පෙළ සම්බන්ධ අලෙවිකරණ තීරණ

iv. සීමිත හෙවත් සුවිශේෂී බෙදාහැරීම සහ පුළුල් හෙවත් දැඩි බෙදාහැරීම් ක්‍රමවේද වල භාවිතය

v. නව අලෙවිකරණ සන්නිවේදන මාධ්‍ය භාවිතය සහ එහි ප්‍රයෝජන

vi. වෙළඳ නාමකරණය හෙවත් සන්නාමකරණයේ වැදගත්කම සහ එහි අභියෝග.

**(ලකුණු 05*4 = මුළු ලකුණු 20)**

*************************************

110

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - **2024/2025**

තුන්වන වසර - පළමු සෙමෙස්තර පරීක්ෂණය

**(පවත්වන ලද්දේ මාර්තු 2025)**

# BLM 3133

# Trade Unionism and Trade Union Movement in Sri Lanka

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

(01) වෘත්තීය සමිති සහ වෘත්තීය සමිතිවාදය යනු මොනවාදැයි පැහැදිලි කොට ඒවායේ ආරම්භය සහ ව්‍යාප්තිය විමර්ශනය කරන්න. (ලකුණු 25)

(02) වෘත්තීය සමිතිවාදය පිළිබඳ කාර්මික ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය විභාග කරන්න. (ලකුණු 25)

(03) වෘත්තීය සමිති සහ වෘත්තීය සමිතිවාදය පිළිබඳ මාක්ස්-ලෙනින්වාදී විග්‍රහය පැහැදිලි කොට කැරලි න්‍යාය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 25)

(04) වෘත්තීය සමිතිවල මූලිකාංග සහ මූලධර්ම මොනවාදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 25)

(05) දේශපාලනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති සමඟ වෘත්තීය සමිතිවාදයේ ඇති සම්බන්ධතාව විමර්ශනය කරන්න. (ලකුණු 25)

(06) ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ආරම්භ වූ දේශපාලන,ආර්ථික සහ සමාජ-සංස්කෘතික පසුබිම කවරාකාරදැයි පෙන්වා දෙන්න. (ලකුණු 25)

(07) ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ විවිධ අවධි නම් කොට ඒ කාලවල වෘත්තීය සමිතිවාදයේ විශේෂතා සාකච්ඡා කරන්න. (ලකුණු 25)

(08) පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් (02) පිළිබඳ සටහන් ලියන්න.

(i) වෘත්තීය සමිතිවාදය පිළිබඳ කෝල් න්‍යාය

(ii) වෘත්තීය සමිතිවාදය පිළිබඳ මානව සම්බන්ධතා න්‍යාය

(iii) ශ්‍රී ලංකාවේ 1953 හර්තාලය

(iv) ශ්‍රී ලංකාවේ මෑත කාලීන වෘත්තීය අරගල (ලකුණු 25)

041

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - 2022/23

තුන්වන වසර - පළමු සෙමෙස්තර පරීක්ෂණය

(පවත්වන ලද්දේ මාර්තු 2025)

# BLM 3134

# Industrial Relations

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

## අ කොටස

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න

(01) (අ) වැඩ වර්ජනය කිරීමේ අයිතිය කම්කරුවා සතුව පවතින ප්‍රබල අවියකි. වැඩ වර්ජනය කිරීමේ අයිතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින නෛතික ප්‍රතිපාදන පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(ආ) වැඩ වර්ජනය කිරීමේ අයිතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින නෛතික සීමාවන් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 5)

(02) (අ) කාර්මික ආරවුලක් යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 5)

(ආ) කාර්මික ආරවුලක් විසඳීමේදී කම්කරු කොමසාරිස්වරයා සතු බලතල හා කාර්යය විස්තර කරන්න

(ලකුණු 5)

(ඇ) අනිවාර්යය බේරුම්කරණය හා ස්වේච්ඡා බේරුම්කරණය අතර වෙනස පැහැදිලි කරන්න

(ලකුණු 5)

(ඈ) කාර්මික අධිකරණයකින් ලබාදුන් තීන්දුවක් යළි සලකා බැලීමට කරන ඉල්ලීමක් සම්බන්ධයෙන් කාර්මික අධිකරණයක් සතුව පවතින බලය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 5)

(03) අ) යම් සේවකයෙකු පාරිතෝෂික දීමනාවක් ලබාගැනීමට ඉටු කළ යුතු කොන්දේසි කවරේද යන්න විස්තර කොට පාරිතෝෂික දීමනාව ගණනය කරන අයුරු උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) සේවක අර්ථසාධක අරමුදලින් යම් සේවකයෙකුට විශ්‍රාම යාමට පෙර ලබා ගත හැකි ප්‍රතිලාභ පිලිබඳ සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 10)

## ආ කොටස

ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න

(04) i) සේවක සබඳතා කාර්මික සබඳතා සඳහා බලපාන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න.

ii)සේවක සම්බන්ධතා ගොඩනගා ගැනීමට සුදුසු ක්‍රමවේදයන් නිර්මාණය කරන්න.

(ලකුණු 10 x 2 = 20)

(05) i) සේවක සෞඛ්‍ය හා යහපැවැත්ම හඳුන්වා දී එහි වැදගත්කම පැහැදිලි කරන්න.

ii)සේවක යහපැවැත්ම ඉහළ නැංවීමට අදාලව සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න.

(ලකුණු 10 x 2 = 20)

(06) i) සේවක විවිධත්වය ආයතනයකට බලපාන ආකාර 05ක් හඳුන්වා උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

ii) සේවක විවිධත්වය (Employee Diversity) කළමනාකරණයට සුදුසු උපක්‍රම 04ක් හඳුන්වා දෙන්න.

(ලකුණු 10 x 2 = 20)

(07) i) සේවයේ යෙදීම සම්බන්ධයෙන් කාන්තාවන් මුහුණපාන ගැටලු 05 හඳුනාගෙන සුදුසු ක්‍රමවේදයන් හඳුන්වා දෙන්න.

ii) ළමා ශ්‍රමය පිළිබඳ නවකථා හඳුනාගෙන එයින් 5ක් පැහැදිලි කරන්න.

(ලකුණු 10 x 2 = 20)

(08) i) කාර්මික සාමය (Industrial Piece) සහ සේවක රඳවාගැනීම (Retention) සඳහා සුදුසු උපක්‍රම 05 සහිතව කෙටි වාර්තාවක් සකසන්න.

(ලකුණු 10 x 2 = 20)

***************************

IHRA
UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - 2022/23

තුන්වන වසර - පළමු සෙමෙස්තර පරීක්ෂණය

(පවත්වන ලද්දේ මාර්තු 2025)

# BLM 3135

# Financial Management

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

(Non Programmable Calculator are Allowed)
(වැඩසටහන්ගත කළ නොහැකි ගණක යන්ත්‍ර සඳහා අවසර ඇත.)

(01) i) මූල්‍ය කළමනාකරණය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද ? (ලකුණු 04)

ii)අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම, මූල්‍ය කළමනාකරණයේ තීරණාත්මක කාර්යයන් ලෙස සළකන්නේ ඇයි? (ලකුණු 10)

iii) (අ) මූල්‍ය කළමනාකරු විසින් ගනු ලබන ප්‍රධාන තීරණ මොනවාද? (ලකුණු 06)

(ආ) ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සාර්ථක කර ගැනීම සඳහා කාරක ප්‍රාග්ධන කළමනාකරණයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

(02) i) මූල්‍ය තීරණ ගැනීමේ දී මුදලේ කාලීන වටිනාකම වැදගත් වන්නේ ඇයි ? (ලකුණු 04)

ii) සඳුනි මහත්මිය තම දරුවාගේ උසස් අධ්‍යාපනය සඳහා සැලසුම් කරමින් සිටින අතර, වසර 8කින් රු.250,000 ක් අවශ්‍ය වේ. ඇයට දැන් මුදල් ඉතුරුම් ගිණුමක තබා ගැනීමට හෝ වසර 8කින් පසු රු.250,000 ක සහතික කළ මුදලක් ලැබෙන තෙක් බලා සිටීමට විකල්පයන් දෙකක් ඇත.

වර්තමාන වෙළඳපොල පොලී අනුපාතය වාර්ෂිකව 14.5% ක් බව මූල්‍ය උපදේශකවරියක් ඇයට දන්වා සිටී.

(අ) අද දින එකවර මුදලක් ආයෝජනය කළ යුතුද, නැතහොත් අනාගත ගෙවීම සඳහා රැඳී සිටිය යුතුද යන්න අවශ්‍ය ගණනය කිරීම් සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ආ) මෙම මූල්‍ය තීරණය ගැනීමේ දී සඳුනි මහත්මිය සළකා බැලිය යුතු අනෙකුත් සාධක මොනවාද? (ලකුණු 05)

iii)පෙරේරා මහතා මෑතකදී තමා සීයා කෙනෙකු වීමට යන බව දැනගත්තේය. ඔහු තම නව මුණුබුරාගේ උසස් අධ්‍යාපනය සඳහා වසර 18 කට පසු ලැබෙන පරිදි අද දින යම් මුදලක් ආයෝජනය කිරීමට තීරණය කර ඇත.

ඔහු වසරකට 12% ක පොලී අනුපාතයක් යටතේ මුදල සංයුක්ත වන පරිදි අද දින රු.10,000 ක් ආයෝජනය කර ඇත. මෙම ආයෝජනය වසර 18 ක් සඳහා මෙම ගිණුමේ තැබීමට ඔහු සැලසුම් කරයි.

ඔහුගේ මුණුපුරාට වසර 18 කින් පසුව මුණුබුරාගේ උසස් අධ්‍යාපනය සඳහා කොපමණ මුදලක් ලබාගත හැකි වේද ? (ලකුණු 10)

(මුළු ලකුණු 25)

(03) සමාගමක් රු.500,000 ක වියදමින් වන යන්ත්‍රයක් ස්ථාපනය කිරීම සඳහා ආයෝජන යෝජනාවක් සළකා බලමින් සිටී. මෙම යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය අවුරුදු 05ක් වන අතර, ඉන්බුන් වටිනාකමක් නොමැත. බදු අනුපාතය 35% කි. සමාගම විසින් යන්ත්‍ර සූත්‍ර සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීමේ ක්‍රමය භාවිතා කරන බවත්, බදු අරමුණු සඳහා එම ක්ෂය අඩු කිරීමට අවසර දී ඇත. ක්ෂය වියදම සහ බදු වියදම අඩු කිරීමට පෙර ඇස්තමේන්තු ගත ලාභයන් පහත පරිදි වේ.

| අවුරුද්ද | ඇස්තමේන්තුගත ලාභය |
|---|---|
| 1 | රු.12,000.00 |
| 2 | රු.13,500.00 |
| 3 | රු.14,000.00 |
| 4 | රු.15,500.00 |
| 5 | රු.12,500.00 |

- මෙම ආයෝජනයේ / ව්‍යාපෘතියේ ප්‍රාග්ධන පිරිවැය 10% කි.

i) (අ) ව්‍යාපෘතිය සඳහා ශුද්ධ වර්තමාන අගය (NPV) ගණනය කරන්න. (ලකුණු 12)

(ආ) ශුද්ධ වර්තමාන වටිනාකමේ තීරණ රීතිය මත පදනම්ව, සමාගම ව්‍යාප්පෘතිය පිළිගත යුතුද? නැතහොත් ප්‍රතික්ෂේප කළ යුතුද ? යන්න පැහැදිලි කරන්න. (ලකුණු 01)

ii)(අ) ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය (IRR) ගණනය කරන්න. (ලකුණු 10)

(ආ) අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතයේ තීරණ නිර්ණායකයට අනුව,සමාගම ව්‍යාපෘතිය පිළිගත යුතුද? නැතහොත් ප්‍රතික්ෂේප කළ යුතුද ? යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 25)

(04) i) ABC සමාගමේ බීටා අගය (beta) අගය 1.6 ක් යැයි උපකල්පනය කරන්න. වෙළඳපල අවදානම් වාරිකය (risk premium) 9% ක් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, වර්තමාන අවදානම් නිදහස් අනුපාතය (risk free rate)7% කි. සමාගම විසින් විශ්ලේෂකයින්ගේ ඇස්තමේන්තු භාවිතා කර සමාගමේ කොටස්වල ලාභාංශ වසරකට 6% කින් වර්ධනය වනු ඇතැයි විශ්වාස කරනබවත් අවසාන ලාභාංශය (last Dividend) රු.20 ක් බවත් තීරණය කර ඇත. දැනට සමාගමේ කොටසක් රු.105 කට වෙළඳපොල තුළ අලෙවි වේ.

ලාභාංශ වර්ධන ආකෘතිය (Dividend growth model) සහ ආරක්ෂණ වෙළඳපොල රේඛාව (security market line) ප්‍රවේශය භාවිතා කරමින් කොටස් ප්‍රාග්ධනයේ පිරිවැය "Cost of equity" ගණනය කරන්න. (ලකුණු 12)

ii) සමාගමක කොටස්වල වෙළඳපල වටිනාකම රු.50,000,000 සහ ණයවල වෙළඳපල වටිනාකම රු.30,000,000 වේ. සමාගමේ කොටස් ප්‍රාග්ධනයේ පිරිවැය "Re" 12% ක් වන අතර, ණය ප්‍රාග්ධනයේ පිරිවැය (Rd) 8% ක් වේ. ආයතනික බදු අනුපාතය (Tc) 30% කි.

(අ) ප්‍රාග්ධන ව්‍යුහයේ බර තැබූ අගයන් "Capital structure weights" ගණනය කරන්න

(ලකුණු 06)

(ආ) බරිත සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය සූත්‍රය භාවිතා කරමින් සමාගමේ බරිත සමානාය ප්‍රාග්ධන පිරිවැය (WACC) ගණනය කරන්න. (ලකුණු 07)

**(මුලු ලකුණු 25)**

(05) i) මූල්‍ය කළමනාකරණයට අනුව, මුලු ප්‍රතිලාභයේ කොටස් මොනවාද ? (ලකුණු 01)

ii) 2024 වර්ෂය ආරම්භයේ දී XYZ සමාගමෙහි කොටසක මිල රු.120 කි. සිල්වා මහතා මෙම අවස්ථාවේ දී සමාගමේ කොටස් 100 ක් මිල දී ගත්තේය. තවද, 2024 වර්ෂය සඳහා කොටසකට රු.25 බැගින් ලාභාංශ ගෙවීමට තීරණය කරන ලදී.

(අ) 2024 වර්ෂය අවසානයේ දී සිල්වා මහතාට ලාභාංශවලින් ලැබෙන ප්‍රතිලාභය කොපමණද? (ලකුණු 04)

(ආ) ඉහත (අ) හි ගණනය කරන ලද ලාභාංශ ප්‍රතාලාභය කොටස් මිලෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරන්න. (ලකුණු 04)

(ඇ) 2024 වර්ෂය අවසානයේ දී සමාගමේ කොටසක මිල රු.135 දක්වා ඉහල ගියේ නම්, සිල්වා මහතාට ලැබෙන ප්‍රාග්ධන ලාභය (Capital gain) කොපමණද ? (ලකුණු 04)

(ඈ) ඉහත (ඇ) හි ගණනය කරන ලද ප්‍රාග්ධන ලාභය ආරම්භක කොටස් මිලෙහි ප්‍රතිශතයක් ලෙස දක්වන්න. (ලකුණු 04)

(ඉ) 2024 වර්ෂය අවසානයේ දී සමාගම කොටසක මිල රු.110 ක් දක්වා පහත වැටී ඇත්නම්, සිල්වා මහතාට කොපමණ ප්‍රාග්ධන ලාභයක් සිදුවනු ඇද්ද ? (ලකුණු 03)

iii) සමාගමක කොටස්වල ප්‍රතිලාභය ගණනය කිරීමේ දී ප්‍රතිශත ලෙස ප්‍රතිලාභ ගණනය කිරීම වඩාත් පහසු වන්නේ ඇයිද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

**(මුලු ලකුණු 25)**

*******************